

# වෙදාගේ ගාස්තුව

එක් කැලෑවක සිටි හිවලෙක් කෑම සොයමින් ඇවිද්දා. සතකුගේ මළකුණක් උෟට සම්බ වුණා. උෟ ඒ මළකුණ කන විට උගුරේ කටුවක් හිර වුණා.

ඒ කටුව එළියට ගත් කෙනකුට ඉල්ලන ඕනෑ ම දෙයක් දෙන බව හිවලා කිව්වා. කාටවත් ඒක කරන්න බැරි වුණා. එක් කොකෙක් තෑග්ග ලබා ගන්නා පිණිස කටුව එළියට ගන්න කැමති වුණා. කොකා හිවලාගේ උගුරට හොට දමා කටුව ගත් කල උගේ වේදනාව නැතිව ගියා. එවිට කොකා උගෙන් තෑග්ග ඉල්ලුවා.

"මිත්‍රය, ඔබට තවත් මොන තෑග්ගක්ද? මා ඔබ මරණයෙන් බේරුවා. ඔබේ හිස මගේ කට ඇතුළේ තිබෙද්දී මා කට වැසුවා නම් ඔබ මැරෙනවා" යයි හිවලා කීවා.

